**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2000**

මගේ අංකය: II/719 ඊ/302/115
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2000 ජුලි මස 19 වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් /ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන්**
**රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීම.**

උක්ත කරුණට අදාළව 1994.01.10, 1995.02.07 සහ 1995.07.11 යන දිනයන්හි පිළිවෙලින් නිකුත් කර ඇති අංක 2/94, 02/94(II) සහ 02/94(III) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛද 1995.07.19 දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපියද වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන අතර ඒ වෙනුවට පහත සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය.

02. ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය හා කාර්මික විද්‍යාල වැනි රාජ්‍ය පුහුණු ආයතනවල පාඨමාලා හදාරා සුදුසුකම් ලත් සිසුන් විසින් ප්‍රායෝගික පුහුණුව ලබා ගැනිම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීමේ බලය වහාම ක්‍රියාත්මක වන පරිදි සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට, ප්‍රධාන ලේකම්වරුන්ට හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට පවරනු ලැබේ.

03. ඒ අනුව ප්‍රායෝගික පුහුණුව ලබාදීමට අදහස් කරන සුදුසුකම්ලත් අයගේ අයදුම්පත් මෙයට අමුණා ඇති ආකෘති පත්‍රය අනුව පිටපත් දෙකකින් (2) කින් යුක්තව සම්පූර්ණ කොට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සමග අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

04. මෙහි 6 ඡේදය යටතේ දක්වා ඇති තාක්ෂණික ගණයේ ප්‍රායෝගික පුහුණුවක් හැර අනිකුත් සෑම ප්‍රායෝගික පුහුණුවක්ම අනිවාර්යෙන්ම මාස හයකට සීමා කළ යුතුය.

05. අවශ්‍ය ප්‍රතිපාදන සැලසී ඇත්තේ නම් පමණක් පුහුණුවීම් සඳහා දෛනිකව රු.75/- දීමනාවක් ගෙවිය හැකි අතර ඊට අමතරව වෙනත් කිසිදු දීමනාවක් හෝ පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතුය.

06. මාස හයකට වැඩි ප්‍රායෝගික පුහුණු කාලයක් ලබාදිය යුතු පාඨමාලා ලෙස දැනට හඳුනාගෙන ඇත්තේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා ඊට අනුබද්ධ කටුනායක තාක්ෂණඥයන් පුහුණු කිරීමේ ආයතනය, මොරටුව ආධුනික පුහුණු කිරීමේ ආයතනය සහ ශ්‍රී ලංකා මෝටර් යාන්ත්‍රික ඉංජිනේරු ආයතනය යන ආයතනයන්හි පවත්වාගෙන යන තාක්ෂණික පාඨමාලාවන් පමණකි. එම පුහුණුව පාඨමාලාවේ නිර්දේශිත ප්‍රායෝගික පුහුණු කාලසීමාව නොඉක්මවිය යුතුය.

07. පුහුණුවන්නන් පුහුණුව සඳහා ආයතනයකට අනුයුක්ත කරන විටදී ඔවුනට ආයතනයේ කිසියම් තනතුරක වගකීම් නොපැවරිය යුතුය.

08. ප්‍රායෝගික පුහුණුව ලබන්නන්ට රජයේ ස්ථිර හෝ ස්ථිර නොවන සේවකයෙකුට හිමි කිසිදු වරප්‍රසාදයක් හිමි නොවන බව පැහැදිලිවම ලිඛිතව දැනුම් දිය යුතුය. තවද ප්‍රායෝගික පුහුණුව සඳහා ආවරණ අනුමැතිය ලබාදීමක්ද නොකළ යුතුය.

මහින්ද බන්දුසේන
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

# ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා අයදුම්පත්‍රය

මගේ අංකය: .................................
දිනය: ...........................................

අමාත්‍යාංශ ලේකම්/ප්‍රධාන ලේකම්
දිස්ත්‍රික් ලේකම්

## I කොටස

01.
01:1 කාර්යාලය: ..............................................................................................................
01:2 පුහුණුවට යොමු කරන ආයතනයේ නම:- ....................................................................
01:3 යොමු අංකය හා දිනය:- ...................................................................................................

02. පුහුණුව ලබාදීමට අදහස් කරන අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර:

| පුහුණුව ලබන්නාගේ නම (1) | විෂයය (2) | ආරම්භක දිනය (3) | අවසාන දිනය (4) | කාලය (මාස) (5) |
|---|---|---|---|---|
| I | | | | |
| II | | | | |
| III | | | | |
| IV | | | | |

03. ඉහත නම් සඳහන් ප්‍රායෝගික පුහුණුව ලබන්නන්ට ගෙවීම සඳහා ප්‍රතිපාදන ඇත/නැත.

ඉහත නම් සඳහන් පුහුණුවන්නන්ට එහි සඳහන් කාල සීමාව සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීම නිර්දේශ කරමි/නොකරමි. පුහුණුව ලබන දිනකට රු.75/- ක (හැත්තෑපහක) දීමනාවක් ලබාදිය හැක/නොහැක.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන: ....................
නම: ..........................................................................
තනතුර: ......................................................................

## II කොටස

මගේ අංකය: .................................
දිනය: ...........................................

01. පළමුවන කොටසේ නම් සඳහන් පුහුණුවන්නන්ට ඊට ඉදිරියෙන් සඳහන් හයමසක (06)/අවුරුදු ............ කාලය සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම අනුමත කරමි/නොකරමි. පුහුණුව ලබන එක් දිනකට රුපියල් 75 (හැත්තෑපහ) බැගින් ගෙවීම අනුමත කරමි/නොකරමි.

..............................................
අමාත්‍යාංශ ලේකම්/ප්‍රධාන ලේකම්
දිස්ත්‍රික් ලේකම්